# මානව අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ ආකල්පය

*Amila Kaluarachchi*


## Abstract

Recently, the attention of human rights has become one of the most famous topics discussed in society. Many discussions of the human rights in the present reveals that Buddhism, which highly values human potential, is an ideal teaching that discussed human rights among world religions. In 1948, all countries of the United Nations gathered to establish the declaration of Human Rights. Since this gathering, the modern human rights came into being as a worldwide convention and law. There are many similarities between the religious power of the Brahmins in Indian society in the sixth century BC and the power of the church in medieval Western society. However, by the time of the Buddha, the Buddhist and Jain sources emphasize that how the power of Brahmin was collapsing. In the same manner the mercantile class in Western society came to the fore by curbing religious tyranny, wealthy merchants were establishing their authority in Indian society. The rise of new religious traditions, patronaged by the merchant community in India, may seem to have paralleled the development of science and art in the West. It is not surprising that humanist thought is common to both societies because the social condition of the sixth century and the religious condition that developed in association with it are similar to the western social condition of the Renaissance period. Our focus here is to examine whether human rights are in agreement with the teachings of Buddhism, to study whether human rights are evident in Buddhist teachings and what kind of usage this modern concept has inherited in the common society. The research method used for this study is qualitative method. Data collection for the present study has been collected from primary, secondary, and tertiary sources based on the Buddhist literature and conclusions have been drawn by scrutinizing the data through interpretative data analysis.


JOURNAL OF THE FACULTY OF HUMANITIES -32

***Keywords:*** Human Rights, Buddhist Teaching, Concept of Equity and equality, Social Wellbeing

## 1. හැඳින්වීම

මානව හිමිකම් යනු වර්තමාන සමාජ සංදර්ශය තුළ වැඩි වශයෙන් අවධානයට හා සාකච්ඡාවට බඳුන් වන විෂය ක්ෂේත්‍රයකි. එයට ආසන්නතම හේතු වශයෙන් දැක්විය හැක්කේ අනවරතයෙන් සිදුවන මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය වීමේ සංසිද්ධීන්ය. 1948 එක්සත් ජාතීන්ගේ සංගමයෙහි සියලු රටවල් එක් වී සකස් කරගත් මානව හිමිකම් ප්‍රඥප්තිය ඇසුරු කරමින් ලෝක ව්‍යාප්ත සම්මුතියක් හා නීතියක් වශයෙන් නූතනයේ මානව හිමිකම් ක්‍රියාවට නැගේ. එසේම මානවයාගේ විභව ශක්තිය ඉහළින්ම අගය කළ බුදුදහම මානව හිමිකම් පිළිබඳ සාකච්ඡා කළ පරමාදර්ශී ඉගැන්වීමක් බව පැහැදිලිය. මෙහිදී අපගේ අවධානය යොමු වන්නේ මානව හිමිකම් බුදුදහමෙහි ඉගැන්වීම්වලට එකඟදැයි යන්න පරීක්ෂා කිරීමත්, බෞද්ධ ඉගැන්වීම් තුළ මානව හිමිකම් විද්‍යමාන වේද? යන්නත් මෙම නූතන සංකල්පය පොදු සමාජය තුළ කෙබඳු භාවිතයක් උරුම කොට ඇත්තේ ද යන්නත් අධ්‍යයනය කිරීමයි.

මානවයා යනු මිනිස් වර්ගයා ලෙස පොදුවේ විග්‍රහ කරතත් විවිධ ආගමික ඉගැන්වීම් හමුවේ මානව ශක්‍යතාව විවිධත්වයට පත්වනු පෙනේ. විශේෂයෙන් දේවවාදී ආගම් තුළ මිනිසාගේ ශක්තිය දෙවියන්ට හෝ මහාබ්‍රහ්මයාට පරාධීන කොට ඇත. ඒ තුළ මානව පෞරුෂය සහ ධාරිතාව සීමා සහිත වනු දැකිය හැකිය. යමෙක් පුබ්බේකතහේතුවාදය හෝ නියතිවාදය හෝ අධිච්චසමුප්පන්නවාදය හෝ පිළිගනී ද ඔහු ඍජුවම මානව ශක්‍යතාව පිළිනොගන්නා අයෙකු වේ. එසේ වුවත් 14 වන ශත වර්ෂයේ දී බටහිරින් මතුව ආ මානව වාදය නමැති නව මතවාදය ලෞකික දර්ශනයක ස්වරූපය ඉසිලුවද මිනිසාගේ අයිතිවාසිකම් පිළිබඳ පැහැදිලි විග්‍රහයක නිරත වෙයි. ඔවුන්ගේ එක් නිර්වචනයක් වූයේ ''ආගම මිනිසා විසින් ගොඩනගා ගත්තක් බැවින් ඊට යටත් වීමට මිනිසාට අවශ්‍යතාවක් නොමැත'' යනුවෙනි. මෙම දර්ශනය නව චින්තනයක ආරම්භයක් විය. ඔවුන් තවදුරටත් පැහැදිලි කොට සිටියේ ආගමකින් මිනිසාගේ අයිතිවසිකම් වසා තබන්නේ නම් ඔහුට නව ආගමක් නිර්මාණය කර ගැනීමේ හැකියාවක් ඇති බවයි. සාම්ප්‍රදායික දේවවාදය කේන්ද්‍රකොට ගත් බටහිර දර්ශනයට ඉතාලි ජාතික පෙට්‍රාක් (Petrak) විසින් ඉදිරිපත් කළ මානවවාදී චින්තනය ප්‍රබල අභියෝගයක් විණි. පසුකාලීනව ඔගස්ටේකොම්ට්ගේ යථානුභූතවාදය ද මෙම මානවවාදී චින්තනයට ප්‍රබල රුකුලක් විය. 16 වන සියවසෙහි කාර්මික විප්ලවයත් සමග බටහිර වෙළඳ ආධිපත්‍ය හමුවේ විපරිණාමයට පත් සමාජ චින්තනය ක්‍රිස්තියානි පල්ලියෙහි බලය බිඳ දැමූ විද්‍යාත්මක මාවතක් විවර කළ නව දිශානතියක් ගත්තක් විය. බලය පල්ලියේ සිට ධනවතුන් දක්වා ගලායාම හේතුවෙන් නව වෙළඳ පංතියක්, සේව්‍ය - සේවක සමාජයක් බිහිවුණි. තත් සේවකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ යෝජනා හා සම්මුති ගොඩනැගෙමින් තිබුණු අවදියකි 19 හා 20 වන සියවස්. දෙවන ලෝක යුද්ධයෙන් පසුව ගැඹුරින් සාකච්ඡාවට භාජනය වූ මානවවාදයේ ප්‍රතිඵලයක් ලෙස 1948 දෙසැම්බර් 10 වන දින විශ්ව මානව හිමිකම් ප්‍රකාශනයක් ස්ථාපනය කරන්නට විණි. එහි ප්‍රධානම අරමුණ වූයේ නිදහස, සාධාරණය සහ සාමය බලපවත්නා සමාජයක් උදෙසා මිනිසාගේ ගෞරවණීය බව හා සමානාත්මතාව සුරැකීමයි.[1]

1 United Nations Universal Declaration of human rights, 1948, p. 1.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

බටහිර සමාජය තුළ මතුවෙමින් ආ මෙම නව සමාජ ප්‍රවණතාවෙහි ඵලයක් ලෙස මානව හිතවාදීත්වය සැලකිය හැකිවා සේම ක්‍රි. පූ. 6 වන ශතවර්ෂයෙහි බුදුසමයේ පහළ වීම හමුවේද මෙවැනිම සමාජ, ආර්ථික, දේපාලන හා ආගමික චින්තනයක් දියුණු වී පැවැති බව පැහැදිලි කරුණකි.* එහි ප්‍රතිඵලයක් ලෙස චින්තනයේ නිදහස හා ප්‍රකාශනයේ නිදහස සමාජගත වී පැවතිණි.[2] **මජ්ඣිමනිකායේ අරියපරියේසන සූත්‍රයේ** එන **''කිං කුසලගවෙසි''** යන සංකල්පයෙන් සත්‍ය සොයා පර්යේෂණ කිරීමත්, **මහාජනක ජාතකයෙහි** එන සත්‍ය තමන් තුළින් සෙවීමේ සංකල්පය ද ක්‍රියාත්මක කිරීමත් මෙම යුගයේ මානවවාදී චින්තනයේ උපරිමය සලකුණු කරයි. සමකාලීන ඇතැම් අදේවවාදී ආගමික සම්ප්‍රදායයන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කළ ද පුද්ගලත්වයට හානිදායක වන ලෙස එබඳු ආගමික ඉගැන්වීම් ඉදිරිපත් වී තිබිණි. ජෛන ආගමික ඉගැන්වීම් තුළින් ඉදිරිපත් වූ පුබ්බේකතහේතුවාදයෙහි[3] පවතින්නේ මානව ශක්‍යතාව හා ස්වච්ඡන්දතාව අදෘශ්‍යමාන කර්මයකට පවරා දීමයි. ඒ අනුව බුදුසමට පහළ වූ ක්‍රි.පූ හයවන සියවස තුළ ශ්‍රමණ චින්තනයන් කිහිපයක් ම මානවවාදයට ප්‍රතිවිරුද්ධ අදහස් දැරූ බවට සාධක හමු වේ.

* මධ්‍යකාලීන බටහිර සමාජයෙහි පල්ලිය සතුව පැවති බලය හා සමානවම ක්‍රි. පූ. 6 වන ශතවර්ෂය වන විට බ්‍රාහ්මණයින් තම බලය ගොඩනගාගෙන තිබුණු අයුරු පොදුවේ දැකිය හැකි තත්ත්වයකි. නමුත් බුද්ධකාලය වන විට තත් බ්‍රාහ්මණ ආධිපත්‍ය බිඳ වැටෙමින් තිබුණු ආකාරය බෞද්ධ හා ජෛන සූත්‍රාගත තොරතුරු මගින් අවධාරණය කළ හැකි වේ. බටහිර සමාජයෙහි වෙළඳ පංතිය ආගමික බලාධිකාරය මැඩ පවත්වමින් ඉදිරියට පැමිණියා සේම ක්‍රි.පූ. 6 වන සියවස වන විට සිටුවරු තම අධිපතීත්වය සමාජයෙහි ස්ථාවර කරමින් සිටියහ. බමුණන් විසින් තමන් වෙත ප්‍රදානය කොට තිබූ සමාජ තත්ත්වයට වඩා ඉහළ සමාජ තත්ත්වයක් අපේක්ෂා කළ ඔවුහු ශ්‍රමණ සම්ප්‍රදායේ ප්‍රධාන දායකයන් බවට පත් වී නව ආගමික චිත්තනයකට අතදීම බටහිර සමාජයෙහි ධනපතියන් විසින් දෙවියන් වහන්සේට විරුද්ධව විද්‍යාවේ හා කලාවේ සංවර්ධනය උදෙසා ආයෝජනය කළ පියවර සමග සමානය. මේ නයින් බලන කළ ක්‍රි.පූ. හයවන සියවසේ සමාජ තත්ත්වයත් එය ඇසුරු කරමින් ගොඩනැගුණු ආගමික තත්ත්වයත් පුනර්ජීවන සමයෙහි බටහිර සමාජ තත්ත්වයත් සමග සමාන වීම නිසාම මානවවාදී චින්තනය ද තත් සමාජ දෙකටම පොදුවීම අරුමයක් නොවේ.

[2] පඤ්ඤාරතන හිමි., (2009). *මහමිතව සහ විජිතනන්ද හිමි දෙහිපාගොඩ,* සමය අධ්‍යයනය. පි. 53.

[3]මජ්ඣිමනිකාය 1., (2006). *මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය.* පි. 200.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

## 2. සාහිත්‍ය විමර්ශනය

අපරදිග සාහිත්‍යයේ සම්භාව්‍ය රෝම යුගය හා තත්කාලීන කාව්‍ය විචාරය පිළිබඳ කෙරෙන අධ්‍යයනයේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය රාශියක් පරිශීලනයට හමු වේ. එහෙත් රෝම කාලීන සම්භාව්‍ය ලේඛක පරිෂදය අතුරෙහි සම්භාවනයට පාත්‍ර කාව්‍ය විචාරකයන් දෙදෙනකු වන හොරස් හා ලොංජයිනස්ගේ විචාර සංකල්ප පිළිබඳ පමණක් මෙම සාකච්ඡාව සීමා කෙරේ. පූර්වෝක්ත කෘති ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද ඒ හා බද්ධ අවශේෂ කෘති ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ද පරිශීලනයට ගැනුණු අතර, කාව්‍ය විචාරය පිළිබඳ රෝම කාලීන විචාරකයන්ගේ සංකල්ප නූතන කාව්‍ය විචාරයෙහි ලා කොතෙක් දුරට ඉවහල් වන්නේ ද යන්න පිළිබඳ පර්යේෂණයක රික්තකයක් පවතී. කමණි ජයසේකර විසින් සංගෘහීත **භාෂාව හා සාහිත්‍යකරණය** යන කෘතියෙහි රෝම සාහිත්‍ය විචාරකයන් හා විචාර සිද්ධාන්ත පිළිබඳ සාකච්ඡා කෙරෙන නමුත්, නූතන සිංහල සාහිත්‍යයේ සෞන්දර්ය විනිශ්චයෙහි ලා එකී සංකල්පවල ප්‍රායෝගිකත්වය පිළිබඳ අවධානය යොමු නොවේ. අපරදිග සම්භාව්‍ය සාහිත්‍ය විචාරයේ සෛද්ධාන්තික කාරණා පිළිබඳ රචනා වූ කෘති රැසක් හමු වෙතත් මෙම පත්‍රිකාව එම සංකල්ප නූතන කාව්‍යවල රස භාව අන්වේක්ෂණයෙහි ලා සිදුකරන බලපෑම පිළිබඳ නිදර්ශනාශ්‍රිත අධ්‍යයනයකට මාර්ගය සැලසීම යි.

මානව හිමිකම් පිළිබඳ බෞද්ධාකල්පය විමර්ශනය කිරීමේ දී වර්තමානය වනවිට සිදු කර ඇති විවිධ පර්යේෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ දායකත්වය වැඩි දියුණු වීමට හේතු වේ. බුදුසමයෙහි අන්තර්ගත මානව හිමිකම් පිළිබඳ බුද්ධ දේශනාවන් අධ්‍යයනය කිරීම ලොව බොහෝ විද්වතුන්ගේ අවධානයට යොමු වී ඇති මාතෘකාවක් බව කිවහැකි ය.

මානව හිමිකම් පිළිබඳ සංකල්පය ලෝකයේ සෑම සමාජයකම පහසුවෙන් හඳුනාගත හැකි යැයි උපකල්පනය කළ නොහැකිය. මෙම සංකල්පය ඇතැම්විට නීතිමය අතින් පැහැදිලිව සහ විවිධ වෙනස්කම් පැවැතිය හැකි වුවත්, සත්‍යය යන්න සමග සම්බන්ධ වන ආකාරය විවිධ සංස්කෘතීන්හි විවිධත්වය අනුව වෙනස්වීමත්, එය සම්බන්ධ වන ආකාරය පිළිබඳ පැහැදිලි බවක් නොමැතිකමත් නිසා සමාජයේ බොහෝ දෙනෙකු පීඩා විඳින බව අයිනාද (Inada) නම් පර්යේෂකයා පළකරන ලද *"A Buddhist Response to: The Nature of Human Rights 1"* නම් ශාස්ත්‍රීය අධ්‍යයනය ඔස්සේ පෙන්වා දෙයි. තව ද මානව හිමිකම් පිළිබඳ සංකල්පය කෙරෙහි අවධානය යොමු කිරීමේදී, ආසියාවේ බුදුදහම භූගෝලීය සහ විවිධ මතවාදී සීමා සාර්ථකව තරණය කර, ආසියාව පුරා ව්‍යාප්ත වී ඇති බව පෙන්වා දී ඇත. බුදුදහමෙහි මානව හිමිකම් යන මාතෘකාව ඇසුරින් ඉතා වැදගත් අධ්‍යයනයන් කිහිපයක් සිදුවී තිබේ. එයින් වඩාත්ම වැදගත් කෘති කිහිපයක් පිළිබඳ අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

ඩී. කීවින් (D. Keown) විසින් රචිත *"Buddhism and Human Rights"* (බුදුදහම සහ මානව හිමිකම්) යන අධ්‍යයනය බෞද්ධ ඉගැන්වීම් සහ මානව හිමිකම් මූලධර්ම අතර ගැළපුම පිළිබඳ පුළුල් විමර්ශනයක් සිදුකරයි. එය බෞද්ධ ආචාර ධර්ම සහ මානව හිමිකම් ඡේදනය වන ආකාරයත් මානව හිමිකම් පිළිබඳ කතිකාවට බෞද්ධ ඉගැන්වීම් දායකකර ගත හැකි ආකාරයත් ගවේෂණය කරයි.[4]

---

[4] Keown, D.,(2013). *Buddhism and Human Rights 1*. In *Contemporary Buddhist Ethics* (pp. 57-79). Routledge.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

Tessa J. Bartholomeusz iy John Powers විසින් සංස්කරණය කරන ලද *"Buddhism, Human Rights and Social Renewal"* පර්යේෂණයද වැදගත් කොට සැලකිය හැකිය. මෙම ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍රිකා එකතුව මගින් බුදුදහම සහ මානව හිමිකම් අතර සම්බන්ධය, මානව හිමිකම් සහ සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වල දායකත්වය විමර්ශනය කරයි.[5] Christopher Queen සහ Salli B. King විසින් රචිත *"Engaged Buddhism and Human Rights"* නමැති පර්යේෂණය මගින් මානව හිමිකම් ඇතුළු සමාජ හා දේශපාලනික ගැටලු අධ්‍යයනය කිරීමේදී බෞද්ධ ඉගැන්වීම්හි මැදිහත්වීම අවධාරණය කරයි. බෞද්ධ වෘත්තිකයින් මානව හිමිකම් සහ උපදේශන ක්‍රියාවලියට සම්බන්ධ වී ඇති ආකාරය එහි සාකච්ඡා කරනු පෙනේ.[6]

එම්, ක්ලැස්කින් (M. Clasquin) මානව හිමිකම් න්‍යාය බෞද්ධ *'අනත්ත'* ධර්මය සමඟ සංසන්දනය කිරීමේදී ඇතිවන ගැටලුව දීර්ඝව සාකච්ඡා කරයි. ඔහු එම කෘතියෙන් අවධාරණය කරන්නේ ඍජුව හෝ වක්‍රව කුමන ආකාරයකින් හෝ බුදුසමය මානව හිමිකම් සම්බන්ධයෙන් සුවිශේෂ අවධානයක් යොමු කරනු ලබන[7] පී. ස්ක්මිඩ්ට්-ලියුකෙල් *(P. Schmidt-Leukel*) විසින් සිදුකරන ලද අධ්‍යයනයන් ද බුදුදහම සහ මානව හිමිකම් අතර ඇති සම්බන්ධය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වන ඒවා වශයෙන් සැලකිය හැකිය. බෞද්ධ ඉගැන්වීම් මගින් මිනිසා මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටීමට උන්නදු කරන බවත් සමාජ සාධාරණත්වය විෂයෙහි සාකච්ඡා කිරීමට මෙන්ම ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ සමාජය දැනුවත් කිරීමට උනන්දු කෙරෙන බවත් ස්වකීය පර්යේෂණ මගින් පෙන්වා දී තිබේ.[8]

මෙලෙස විවිධ උගතුන් විසින් මානව හිමිකම් පිළිබඳ බුදුසමයාගත අදහස් සාකච්ඡා කිරීමට යොමු වී ඇති ආකාරය උක්ත පර්යේෂණ හා අධ්‍යයනයන් මගින් මනාව අවධාරණ වේ. මේ අනුව බුදුසමය පිළිබඳ පුළුල්ව හදාරනු ලබන්නෙකුට බෞද්ධ ඉගැන්වීම් මගින් නිරූපණය කෙරෙන මානව හිමිකම් පිළිබඳ සංකල්පය ඉතා ප්‍රබල සංකීර්ණතාවන්ට නතුවන නූතන සමාජ සංදර්භයට අතිශයින් ම මහෝපකාරී වන බව හඳුනාගත හැකිය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -32

[5] Swaris, N., (2000). *Buddhism, Human Rights and Social Renewal*. Asian Human Rights Commission.

[6] Queen, C.S. and King, S.B. eds., (1996). *Engaged Buddhism: Buddhist liberation movements in Asia*. State University of New York Press.

[7] Clasquin, Michel. (1993). Buddhism and Human Rights. *Journal for the Study of Religion*. 6. 91-101.

[8] Schmidt-Leukel, P.(2006). Buddhism and the Idea of Human Rights: Resonances and Dissonances, *Buddhist-Christian Studies.* 33–49.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ක්‍රමය ගුණාත්මක ක්‍රමවේදයයි. අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීම බෞද්ධ සාහිත්‍යය පදනම් කරගෙන සිදු වේ. එහිදී ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික මූලාශ්‍රය අනුසාරයෙන් රැස් කරනු ලබන දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පර්යේෂණ අරමුණු සාධනය වන අයුරින් අධ්‍යයනය සඳහා භාවිත කිරීම අපේක්ෂා කෙරේ.

## 4. දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව

බුදුදහමට අනුව පුද්ගලයා කිසිවකුගේ නිර්මාණයක් නොවේ. ඔහුගේ අපිරිසිදුභාවය ද පිරිසිදු භාවය ද ඔහු විසින් ම ඇතිකර ගනියි.[9] මෝක්ෂය පුද්ගලයාගේ උත්සාහය මතම පවතින බව බෞද්ධ පිළිගැනීමයි.[10] බුදුසමය මගින් මෙසේ මානවයා පිළිබඳ දෘෂ්ටිය දේවවාදීත්වයෙන් බැහැර කොට මානව කේන්ද්‍රීය මාවතකට අවතීර්ණ කිරීමට ක්‍රියාකොට ඇත. නමුත් ඇතැම් සමාජ සංවිධාන මගින් මතු කරනු ලබන මානව හිමිකම් පිළිබඳ සාකච්ජා කිරීමට බුදුසමයට අයිතියක් ඇද්දැයි යන අතාර්කික ප්‍රකාශයට දාර්ශනිකව සාධනීය පිළිතුරක් සැපයීම අත්‍යාවශ්‍ය වූවකි.

බුදුදහමේ මූලික ඉගැන්වීම අනාත්ම සංකල්පය මත ගොඩනැගී ඇත. නිත්‍ය වූ ස්ථිර වූ පුද්ගලයෙකු හෝ වස්තුවක් සදාකාලික වේ යැයි බුදුදහම නොපිළිගනියි. එය එසේ නම් මානවයාගේ හිමිකම් පිළිබඳ සාකච්ඡා කිරීමේ හැකියාවක් බුදුදහමට ඇද්දැයි යන්න යමෙකුට ගැටලු සහගත විය හැකිය. නූතන මානව හිමිකම් පුද්ගලයාගේ ගෞරවණීය බව (dignity) ඉලක්ක කරයි. ඇතැම් බෞද්ධ ඉගැන්වීම්වල සඳහන් වන පරිදි තමන්ට තමන්වද නැති කල[11] මානව හිමිකම් පිළිබඳ අවධානය යොමු කිරීමක් උචිත නොවේ යැයි පෙනී යා හැකිය. එබැවින් යම් යම් ප්‍රකාශයන්හි මතුපිටය අර්ථ සළකා බැලීමේදී බෞද්ධ දර්ශනාගත ඉගැන්වීම් හා මානව හිමිකම් අතර දුරස් බවක් ඇතැයි යමෙකුට තර්ක කළ හැකිය. මෙම විසංවාදී විග්‍රහය තත්කාලීන දාර්ශනික ප්‍රවණතාවන්හි ද දක්නට ලැබෙන ආකාරය මාධ්‍යමික දර්ශනාගත මාධ්‍යමික කාරිකාවෙහි ද ථෙරවාද සම්ප්‍රදායට අයත් අභිධර්මාවතාරයෙහි ද දක්නට ලැබේ.[12]

ගැඹුරුතම දාර්ශනික විග්‍රහයෙහි මෙබඳු තත්ත්වයක් දක්නට ඇතත් ඇතැම් සූත්‍රාගත ඉගැන්වීම් අධ්‍යනයෙහි ද පුද්ගලත්වය තාවකාලිකව පිළිගත් බවක් පෙනී යයි. මෙම තාවකාලිකකරණය සම්මුති වශයෙන් ද සැලකිය හැකිය.

---

9 බුද්දකනිකාය 1., (2006). *ධම්මපදය. අත්ත වග්ගය 9 ගාථාව.* පි. 98. ''සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤං විසොධයෙ.''

10 බුද්දකනිකාය 1., (2006). *ධම්මපදය. 2-5.* ''උට්ඨානෙනප්පමාදෙන..''

11 බුද්දකනිකාය 1., (2006). *ධම්මපදය, අත්ත වග්ගය 4 ගාථාව.* පි. 99. "අත්තාහි අත්තනො නාථො කොහි නාථො පරොසියා."

12 හේවාවිතාරණ., 1919, විසුද්ධිමග්ග, පඤ්ඤාභූමි නිද්දේසය, පි. 472. "කම්මස්සකාරකො නත්ථි විපාකස්ස පටිවෙදකො."

JOURNAL OF THE FACULTY OF HUMANITIES-32

ව්‍යවහාර ලෝකයෙහි ජීවත් වීම සත්‍යාවබෝධයෙහි මූලික අවශ්‍යතාව වන අතර එය පරමාර්ථමය වශයෙන් නොගැනීම බුදුදහමේ ගැඹුරුතම ඉගැන්වීමයි. මාධ්‍යමික දර්ශනයෙහි ද මෙම ව්‍යවහාර ලෝකයේ අවශ්‍යතාව පිළිගත් කරුණකි.[13] **'අත්ත'** යන ශබ්දයට ප්‍රතිවිරුද්ධව අනත්ත සංකල්පය නව සොයා ගැනීමක් ලෙස ඉදිරිපත් කළත් අත්ත යන්න විවිධ අවස්ථාවල බුදුරදුන් විසින් ම භාවිත කළ බව දක්නට ලැබේ.[14] **'අත්ත'** ශබදය භාවිත කළා පමණක් නොව පුද්ගලයා විවිධ ස්වරූපයෙන් හඳුන්වා දෙමින් බොහෝ ස්ථානවල වක්‍රව පුද්ගලත්වය පිළිගත් බවක් ද දක්නට ඇත.[15] පුද්ගලයා යන ප්‍රඥප්තිය පිළිගත්තා පමණක් නොව ඔහු වර්ග කිරීමට යාම තුළ ඇත්තේ සම්මුතිමය වශයෙන් එය පිළිගත් බවට සාක්ෂි සපයන සුලු සාධකයකි. තවද ඇතැම් සූත්‍ර පුද්ගල ශක්‍යතාව සංවර්ධනය කර ගැනීමට මග පෙන්වයි. පුද්ගලයා වැඩිය යුතු ධාතු (**ආරම්භක ධාතු, නික්ඛම ධාතු, පරික්කම ධාතු**)[16] පැහැදිලි කරමින් අත්තකාර සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පැහැදිලි කිරීමක් කොට ඇත. මීට අමතරව ගිහි විනය වශයෙන් සැලකෙන **මංගල, ධම්මික, පරාභව, වසල, සිගාල** වැනි සියලු සූත්‍ර ආචාර විද්‍යාත්මකව පුද්ගල ශික්ෂණය අවධාරණය කරනුයේ පුද්ගලත්වය පිළිගන්නා බැවිනි. එබැවින් මානව හිමිකම් පිළිබඳ බෞද්ධ විග්‍රහයක් ඉදිරිපත් කිරීම උචිත නොවන කාර්යයක් යැයි පුද්ගලයා පිළිබඳ දක්වා ඇති විග්‍රහයන්හි ගැඹුරු අර්ථය තේරුම් නොගැනීමට ඇති දෝෂය මත පදනම්ව තීරණය කිරීම බුද්ධිගෝචර නොවේ.

මිනිසාගේ ජීවිතයේ උපභෝග-පරිභෝග වස්තු බාහිර හා අභ්‍යන්තර පෞරුෂය මෙන් ම පුද්ගල අභිමානය පිළිබඳ බුදුදහම ද සාකච්ඡා කොට ඇත. පංචශීලය විග්‍රහ කිරීමෙන් පැහැදිලි වන්නේ මිනිසාගේ ජීවත්වීම කෙරෙහි තිබූ අයිතිවාසිකම අනුන් විසින් පමණක් නොව තමන් විසින් ද රැකිය යුතු බවයි. දෙවන ශික්ෂාපදයෙන් හා තුන්වන ශික්ෂා පදයෙන් සමාජගත මානවයාගේ භෞතික සම්පත් හා මානව සම්පත්වල අයිතිවාසිකම සුරක්ෂිත කොට ඇත. පළමු ශික්ෂාපදයෙන් සාකච්ඡා වන කරුණු මානව හිමිකම් ප්‍රඥප්තියෙහි දෙවන විගන්තියෙන් පැහැදිලි කොට ස්ථාවර කොට ඇත.[17] එමෙන් ම ඒ හා සමගාමීව යන අංගුත්තරනිකායේ වණිජ්ජා සූත්‍රයේ දී ප්‍රතික්ෂේප කරන ලද වෙළඳාම් අතරට ගැනෙන වහල් වෙළඳාම ද මෙම ප්‍රඥප්තියෙහි හතරවන වගන්තියෙන් තහනම් කොට ඇත.[18] ධම්මපදයේ දණ්ඩ වග්ගාගත ඉගැන්වීම හා සමගාමීව පස්වන වගන්තිය දණ්ඩනය හෝ හිංසනය පිටු දැක තිබේ. එපමණක් නොව ඉහත දී සඳහන් කළ පළමු හා දෙවන ශික්ෂාපද සමග බැඳුණු ජීවත්වීමේ නිදහස සහ ආරක්ෂාව තුන්වන හා 12 වගන්තියෙන් විග්‍රහ කෙරෙයි. අට, නවය හා දහවෙනි වගන්ති පුද්ගලයෙකුගේ ස්වාධීනත්වය අභ්‍යන්තර පෞරුෂය ඔස්සේ සාකච්ජාවට ලක් කෙරෙයි. මහාපරිනිබ්බාන සූත්‍රයේ දක්වන පරිදි සමගිව රැස්වීම අපරිහානීය ධර්මයක් වන අතර මානව හිමිකම්වලට අදාළව එය ඕනෑම විධිමත් සමාජයක සුරැකිය යුතු මානව හිමිකමකි.

[13] මූලමාධ්‍යමකකාරිකා, ශ්ලෝක 24 - 10. "ව්‍යවහාර මනාශ්‍රිත්‍ය, පරමාර්ථං න දෙස්‍යතෙ, පරමාර්ථ මනාගම්‍ය නිර්වාණං නාධිගම්‍යතෙ.''

[14] දීඝනිකාය 3., (2006). *චක්කවත්තිසීහනාද සූත්‍රය.* පි. 96.

[15] අංගුත්තරනිකාය 2., (2006). පි. 258.

[16] අංගුත්තරනිකාය 4., 2006, අත්තකාර සූත්‍රය පි. 94.

[17] ජාත්‍යන්තර මානව හිමිකම් පනත., (1948). දෙවන වගන්තිය.

[18] ජාත්‍යන්තර මානව හිමිකම් පනත., (1948). සිවුවන වගන්තිය.

18 වන වගන්තිය ඉතා ගැඹුරු බෞද්ධ දර්ශනාගත විග්‍රහයක් හා සමානතාවක් දක්වයි. එහි එන පරිදි ඕනෑම අයෙකුට නිදහසේ සිතීමට අවකාශ ඇත. තම ආගම වෙනස් කිරීමටත් ප්‍රසිද්ධියේ පිරිසක් සමග හෝ පුද්ගලිකව හෝ ආගම ඇදහීමටත් ඉගැන්වීමටත් මිනිසාට අයිතිවාසිකම් වේ. මෙම ආගමික නිදහස ප්‍රථමයෙන් ම ප්‍රතික්ෂේප කරනු ලැබුවේ බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළයි. ඒ හැර ක්‍රිස්තියානි, මුස්ලිම් ආදි සියලු දේවවාදී ඉගැන්වීම්හි ද මෙම චින්තන නිදහස හා ආගම් ඇදහීමේ නිදහස අභියෝගයකට ලක්වන ආකාරය දක්නට ලැබේ. එසේ වුවත් ශ්‍රාවකයාට තමන් වහන්සේ පවා විමසීමට නිදහස ලබාදුන් නිදහස් චින්තනයකට මගපෙන් වූ ධර්මයක් දේශනා කිරීමට තරම් බුදුන් වහන්සේ නිර්ව්‍යාජ වූහ.[19] තමන් වහන්සේගේ දේශනාවන් පිළිපැදීමට කැමැත්තක් දැක්වූ උපාලි ගෘහපතියා අරඹයා බුදුරජාණන් වහන්සේ නැවත නැවතත් පවසනුයේ විමසා බලා තීරණයට එළඹෙන ලෙසයි.[20] ඕනෑම අවස්ථාවක බ්‍රාහ්මණයෙකුට හෝ පරිබ්‍රාජකයෙකුට හෝ ඕනෑම ආගමික සාමාජිකයෙකුට බුදුරදුන් හමුවීමේ හා සාකච්ඡා කිරීමේ අවකාශය විවරව තිබීමෙන් පැහැදිලි වන්නේ 18 වන වගන්තිය ද බුදුදහම තුළ පැහැදිලිවම උපයුක්තව පැවැති වැදගත් මානව හිමිකමක් වී විබූ බවයි.

මානව හිමිකම් පිළිබඳ සාකච්ඡා කිරීමේදී සේව්‍ය හා සේවක සම්බන්ධතාවත් සේවකයා කෙරෙහි උරුම විය යුතු නිදහසත් ඉතා ගැඹුරින් සාකච්ඡා කළ ඉගැන්වීමකි බුදුදහම. සිඟාලෝවාද සූත්‍රයේදී සේවකයා කෙරෙහි ලැබිය යුතු අයිතිවාසිකම් මානව හිමිකම් ප්‍රඥප්තියෙහි 24 වන වගන්තියෙන් අවධාරණය කරයි. තවද බ්‍රාහ්මණ සමාජයෙහි නොපැවති, පසුකාලීන ව අග්ගඤ්ඤ සූත්‍රයෙහි අවධාරණය වූ කෙනෙකුගේ වෘත්තිය තෝරා ගැනීම සහ තත් වෘත්තිකයන්ට ඇති ගෞරවණීයත්වය 23 වන වගන්තියෙන් විවරණය වෙයි. තවත් ඉතා වැදගත් බෞද්ධ ඉගැන්වීමක් වන්නේ පුද්ගලයා සිව්පස පරිභෝජනයෙන් පදනම් කොට තැබීමයි. තත් කරුණ මෙම ප්‍රඥප්තියෙහි 25 වන වගන්තියෙන් අවධාරණය කොට ඇත. බුදුදහම හෝ බුදුරජාණන් වහන්සේ දාර්ශනිකව අන්‍යයන්ගේ හිස් බව මද කොට දැක්වුවත් ඇතැම් සංස්කෘතිකමය ක්‍රියාවන් ප්‍රතික්ෂේප නොකළහ.[21] තත් උපසංස්කෘතීන්හි අයිතිවාසිකම 27 වන වගන්තියෙන් පැහැදිලි වේ. මේ නයින් බලන කල සමස්ත මානව හිමිකම් ප්‍රඥප්තිය ම බුදුදහම තුළ සාකච්ඡා කෙරෙන ගැඹුරුතම දාර්ශනික හා සංස්කෘතිකමය ඉගැන්වීම් සමග සමගාමී වීම ඇතමෙකුට පුදුමය එළවන කරුණක් විය හැකිය. නමුත් සමාන සමාජ ආගමික සංස්ථාවක පැන නැගුණු ප්‍රඥප්තියක හා ඉගැන්වීමක සමානතාවක් මතුවීම අරුමයක් නො වේ. මානව හිතවාදී ආගමික ඉගැන්වීමක් වන බුදුදහම මානව හිමිකම් ප්‍රඥප්තියෙහි සාකච්ඡා කෙරෙන කරුණු ද ඉක්මවා යමින් වඩාත් පුළුල් අයිතිවාසිකම් රාශියක් සාකච්ඡා කරනු දක්නට ලැබේ. විශේෂයෙන් මෛත්‍රී භාවනාව වැඩීම තුළ **"භූතා වා සම්භවේසී වා"** වශයෙන් උපන් සත්ත්වයින්ගේ පමණක් නොව මතු උපතක් සොයන සත්ත්වයින්ගේ පවා පැවැත්මෙහි අයිතිය බුදුදහමෙන් පිළිගෙන ඇත. හුදෙක් මෙම ප්‍රඥප්තිය මානවයාගේ භෞතිකත්වය ඉලක්ක කළත් බුදුදහම භෞතික සහ ආධ්‍යාත්මික යන දෙඅංශයම අවධාරණය කිරීම මානව හිමිකම් ප්‍රඥප්තිය ඉක්මවා ගිය තත්ත්වයක් පිළිබිඹු කරයි.

බුදුදහම මානව හිමිකම් ප්‍රඥප්තිය හා එකඟ වන්නේ දැයි යමෙකු ප්‍රශ්න කරද්දී එසේ යැයි පැවසීම සාවද්‍යය. එසේ නොවේ යැයි පැවසීම ද සාවද්‍යය. එසේ ය. එසේ නොවේය යනු ද සාවද්‍ය පිළිතුරකි.

---

[19] මජ්ඣිම නිකාය 1., (2006). *වීමංසක සූත්‍රය.* පි. 744.
[20] මජ්ඣිමනිකාය. 2., (2006). *උපාලි සූත්‍රය.* පි. 74.
[21] දීඝනිකාය 3., (2006). *සිගාල සූත්‍රය.* පි. 304.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

එම සියලු පිළිතුරු සාවද්‍ය වන්නේ බුදුදහම මානව හිමිකම් පමණක් ඇගයූ ඉගැන්වීමක් නොවන බැවිනි. මානව හිමිකම් පිළිගත්තා මෙන් ම සියලු සත්වයින්ගේ හිමිකම් ද (all being rights) බුදුසමය පිළිගනියි. එහි සාමාජිකයින් ලෙස **ථස, ථාවර, දීඝ, මහන්ත, මජ්ඣිම, රස, අනු, ථූල, දිට්ඨ, අදිට්ඨ, දූර, අවිදූර,** වශයෙන් පෙනෙන, නොපෙනෙන, සමීපයේ සිටින, දුර සිටින ලොකු කුඩා සියලු සත්ත්වයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡා කරයි.[22] **දීඝනිකායේ චක්කවත්තිසීහනාද** සූත්‍රයේ දී සක්විතිවත් තුළ සිවුපාවුන් ආරක්ෂා කිරීම ද පාලකයාගේ වගකීමක් වශයෙන් දක්වා තිබේ. ඉන් පැහැදිලි වන්නේ බුදුදහමේ අයිතිවාසිකම් පිළිබඳ ආකල්පය මිනිසා ඉක්ම වූ සමස්ත සත්ත්ව සමාජයට ද අදාළ වූවක් බවයි. බුදුසමයාගත මෙබඳු ඉගැන්වීම්හි ආභාසය ලත් ඇතැම් රාජ්‍ය පාලකයින් ද සත්ත්ව හිංසාවෙන් වැළකී සිටීමට ක්‍රියාකළ අවස්ථා ඉතිහාසයෙන් හමු වේ. භාරතයේ අශෝක අධිරාජයා ක්‍රමක්‍රමයෙන් රජ මාලිගාවේ මස් පිණිස සතුන් නැසීම අත්හළේය. ලංකා ඉතිහාසය තුළ ද ආමණ්ඩගාමණීඅභය රාජසමය සත්ත්ව අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කළ යුගයක් වශයෙන් සැලකිය හැකිය. මෙවැනි පූර්වාදර්ශයන් සඳහා බුදුදහම ඍජුවම බලපා ඇති බව පැහැදිලිය. එපමණක් නොව බෞද්ධ ඉගැන්වීම් තුළින් අවධාරණය වන අභයදාන සංකල්පය ද ලෝක මානව හිමිකම් ප්‍රඥප්තිය ඉක්මවා යන මානව හා සත්ත්ව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම විෂයෙහි ක්‍රියාත්මක වූ හිමිකම් පිළිබඳ පරමාදර්ශී බෞද්ධ සංකල්පයකි.

## 5. නිගමනය

ඉහතින් සාකච්ඡා කළ සියලු කරුණු සැලකිල්ලට ගැනීමේ දී පැහැදිලි වන්නේ වර්තමානයේ ඉතා ලඝු කොට සළකන මානව හා සත්ත්ව අයිතිවාසිකම් බෞද්ධ ඉගැන්වීම් තුළින් මනාව සුරක්ෂිත කොට ඇති බවයි. බුදුසමය ඉදිරිපත් කරන හිමිකම් සම්බන්ධයෙන් වූ මානව චර්යාවන්හි හා ගුණාංගයන්හි ප්‍රායෝගික භාවිතය අන් කවරදාටත් වඩා වර්තමාන සමාජ පසුබිමට බෙහෙවින් උපකාරී වන බව ද නිගමනය කළ හැකි අතර බෞද්ධ ඉගැන්වීම් මානව හිමිකම් ඉක්මවා ගිය ඊටත් වඩා පුළුල් වූ සමස්ත සත්ත්ව සමූහයාගේම හිමිකම් හා අයිතිවාසිකම් තහවුරු කරන සමස්ත ජීව පරිසරයේම යහපත විෂයෙහි මූලාධාර වන විශිෂ්ඨ ඉගැන්වීමක් බවත් නිගමනය කළ හැකිය.

[22] ඛුද්දකනිකාය 1., *ඛුද්දකපාඨ. මෙත්ත සූත්‍රය.* පි. 20.

JOURNAL OF THE FACULTY OF HUMANITIES

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා., (2005). *අංගුත්තරනිකාය.* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා., (2005). *ඛුද්දකනිකාය.* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා., (2005). *දීඝනිකාය.* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා., (2005). *මජ්ඣිමනිකාය.* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා., (2005.). *සංයුක්තනිකාය.* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා., (2006). *සුත්ත නිපාතය.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා., (2006). *ථෙරගාථාපාළි.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

හේවාවිතාරණ සංස්කරණ., (2008). *සුත්ත නිපාත අට්ඨකථා.* පානදුර.

පඤ්ඤාරතන හිමි මහමිතව සහ විජිතනන්ද හිමි දෙහිපාගොඩ., (2009). සමය අධ්‍යයනය. මාගධී. පුවක්පිටිය. අස්සාවේල්ල.

ශාසනරතන හිමි මොරටුවේ., (1970). මාධ්‍යමික දර්ශනය. ස්රාවන්ති ප්‍රකාශන. පානදුර.

හේවාවිතාරණ සංස්කරණ., (1919). විසුද්ධිමාර්ගය. පානදුර.


## References


Abe, M., (1986). *Religious tolerance and human rights: a Buddhist perspective. In: Swidler L (ed) Religious liberty and human rights.* Philadelphia: Ecumenical Press.

Clasquin, M., (1993). *'Buddhism and Human Rights''. Journal for the Study of Religion. 6.* Association for the Study of Southern Africa, pp. 91-101.

Keown, D., (2013). *Buddhism and Human Rights 1.* In *Contemporary Buddhist Ethics*: Oxford: Routledge.

Queen, C.S. and King, S.B. eds., (1996). *Engaged Buddhism: Buddhist liberation movements in Asia*, New York: State University of New York Press.

Schmidt-Leukel, P., (2006). *Buddhism and the Idea of Human Rights: Resonances and Dissonances. Buddhist-Christian Studies.* Hawaii: University of Hawaii Press, pp. 33–49.

Swaris, N., (2000). *Buddhism, Human Rights and Social Renewal*. Hong Kong: Asian Human Rights Commission.

United Nations., (1948). *Universal Declaration of Human Rights*. The UN Commission on Human Rights.

Zandy, J., (2019). *"Universal Declaration of Human Rights", Radical Teacher*, 113, pp. 56–57. doi: 10.5195/rt.2019.591.


JOURNAL OF THE FACULTY OF HUMANITIES -32